සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2023 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2023-02-25
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, පිරිවැය මධ්‍යස්ථානයක් (Cost Centre) සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ශිෂ්‍යයෙක්. (2) බේකරියක්. (3) පාන් ගෙඩියක්. (4) රෝගියෙක්.

(ලකුණු 02)

**1.2** පහත සඳහන් තොරතුරු ගොඩනැගිලි කුළී සම්බන්ධව, **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමෙන්** උපුටාගන්නා ලදී: *(රු.)*

| ගිණුමේ නම | 2022 මාර්තු 31 දිනට | 2021 අප්‍රේල් 01 දිනට |
|---|---|---|
| ඉදිරියට කළ කුළී ගෙවීම | 25,000 | 60,000 |
| උපචිත කුළිය | 45,000 | 90,000 |

සමාගම, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රු.750,000/- ක් කුළී වශයෙන් ගෙවන ලදී.

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කුළී වියදම වනුයේ:

(1) රු.720,000/-. (2) රු.980,000/-. (3) රු.985,000/-. (4) රු.740,000/-.

(ලකුණු 02)

1.3 **සීමාසහිත රාණි සමාගම,** එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. පහත සඳහන් තොරතුරු 2022 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුවට අදාලව සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

| | **රු.** |
|---|---|
| විකුණුම් (එකතු කළ අගය මත බදු රහිතව) | 3,600,000 |
| මිලදී ගැනුම් (බදු ඉන්වොයිසි ඇත)<br>(එකතු කළ අගය මත බදු රහිතව) | 1,600,000 |
| ආපසු එවූ විකුණුම් (එකතු කළ අගය මත බදු රහිතව) | 45,000 |
| 2022 ජනවාරි 01 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමෙහි බැර ශේෂය | 15,000 |

*(අදාලවන එකතු කළ අගය මත බදු අනුපාතිකය 8% ක් වේ.)*

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2022 මාර්තු 31 දිනට එකතු කළ අගය මත බදු (VAT) ගිණුමේ බැර ශේෂය වන්නේ:

(1) රු.175,000/-. (2) රු.141,400/-. (3) රු.156,400/-. (4) රු.171,400/-.

(ලකුණු 02)

1.4 පහත සඳහන් පිරිවැයකරණ ක්‍රම සළකා බලන්න:

**(a)** කාර්ය පිරිවැයකරණය.
**(b)** කාණ්ඩ පිරිවැයකරණය.
**(c)** කොන්ත්‍රාත්තු පිරිවැයකරණය.
**(d)** පෙරසැරි පිරිවැයකරණය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, විශේෂිත ඇණවුම් පිරිවැයකරණ ක්‍රමය / ක්‍රම වන්නේ:

(1) **(d)** පමණි.
(2) **(a)** සහ **(d)** පමණි.
(3) **(b)** සහ **(c)** පමණි.
(4) **(a), (b)** සහ **(c)** පමණි. (ලකුණු 02)

1.5 හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** හවුල්කරුවන්ට, හවුල් ව්‍යාපාරයෙන් වැටුප් ලැබීමට හිමිකම් ඇත.
**(b)** හවුල් ව්‍යාපාරයේ පොත් සහ ලේඛණ පරීක්ෂා කිරීමට සෑම හවුල්කරුවෙකුටම අයිතියක් ඇත.
**(c)** යෙදවූ ප්‍රාග්ධනය මත පොලී ලබාගැනීමට හවුල්කරුවන්ට හිමිකම් ඇත.
**(d)** ලාභා'ලාභ සෑම හවුල්කරුවෙකු අතරම සමානව බෙදිය යුතුය.

ඉහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) **(a)** පමණි.
(2) **(a)** සහ **(c)** පමණි.
(3) **(b)** සහ **(d)** පමණි.
(4) **(b), (c)** සහ **(d)** පමණි. (ලකුණු 02)

**1.6** **A** සහ **B** පිළිවෙළින් 2 : 1 අනුපාතයට ලාභ'ලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක නිරතව සිටී. 2022 මාර්තු 31 දින, **C** හවුල් ව්‍යාපාරයට බැඳුනු අතර, **A, B** සහ **C** අතර නව ලාභ'ලාභ බෙදාගැනීමේ අනුපාතය පිළිවෙළින් 3 : 2 : 1 වේ.

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, **A** ගේ කැපකිරීමේ අනුපාතය (sacrificing ratio) වනුයේ:

(1) $\frac{4}{6}$ (2) $\frac{2}{6}$ (3) $\frac{1}{6}$ (4) $\frac{3}{6}$

(ලකුණු 02)

*අංක **1.7** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** මූල්‍ය ප්‍රකාශනවල සංරචකයන් තුනක්(03) හඳුනා දක්වන්න. (ලකුණු 03)

**1.8** පහත සඳහන් තොරතුරු, **සීමාසහිත ඩීන් (පෞද්ගලික) සමාගමෙන්** උපුටාගන්නා ලදි:

| | |
|---|---|
| දිනකට වැඩකරන සාමාන්‍ය පැය ගණන | පැය 8 |
| පැයක් සඳහා මූලික ගෙවීම | රු.300/- |
| ඒකකයක් නිපදවීම සඳහා ඉඩදෙන සම්මත කාලය | මිනිත්තු 2.5 |
| ප්‍රසාද දීමනාව | ඉතිරි කළ කාලයෙන් 80% ක් මූලික වේතන අනුපාතයට |

සේවකයෙකු දිනකට ඒකක 252 ක් නිපදවයි නම්, එම සේවකයාගේ දිනක ඉපැයීම ගණනය කරන්න. (ලකුණු 04)

**1.9** **සීමාසහිත කාගෝ ලොජිස්ටික්ස් පොදු සමාගම,** සාමාන්‍ය කොටස් 2,000,000 ක් එකක් රු.5/- බැගින් නිකුත් කිරීම සඳහා අයදුම්පත් කැඳවන ලද අතර, කොටස් 4,000,000 ක් සඳහා අයදුම්පත් ලැබී තිබුණි. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2:1 අනුපාතයට කොටස් විභජනය කොට අයදුම්පත් සමඟ ලද අතිරික්ත මුදල් ආපසු ගෙවීමට තීරණය කරන ලදී.

ඉහත ගනුදෙනු සටහන් කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන්, මුදල් සටහන්ද සමඟ පිළියෙල කරන්න. (ලකුණු 03)

**1.10** **සීමාසහිත XYZ සමාගමේ** ගිණුම් පොත්වලින් **A නිෂ්පාදිතයට** අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | : ඒකක 16,000 |
| ඒකකයක ගැනුම් මිල | : රු.20/- |
| ඇණවුමක, ඇණවුම් පිරිවැය | : රු.10/- |
| ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය | : ගැනුම් මිලෙන් 10% ක් වේ. |

ඔබට පහත සඳහන් සූත්‍රය භාවිත කළ හැකිය,
ආර්ථික ඇණවුම් ප්‍රමාණය:
$$\sqrt{\frac{2DC_0}{C_h}}$$

ඉහත සඳහන් තොරතුරුවලට අනුව, **A නිෂ්පාදිතය** සඳහා ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)] ගණනය කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

**ආලෝකා** ට අයත් කේවලස්වාමි ව්‍යාපාරයක් වන **ආලෝකා එන්ටප්‍රයිසස්** හි ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත. **ආලෝකා එන්ටප්‍රයිසස්** ආලෝකකරණ උපාංග ආනයනය කොට දේශීය වශයෙන් බෙදාහැරීමේ ව්‍යාපාරයක නිරතව සිටී.

2022 ජනවාරි 01 දිනට, **ආලෝකා එන්ටප්‍රයිසස්** හි වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---:|---:|
| ගොඩනැගිලි | 25,000 | |
| ගෘහ භාණ්ඩ | 2,500 | |
| සමුච්චිත ක්ෂයවීම් - ගොඩනැගිලි | | 5,000 |
| සමුච්චිත ක්ෂයවීම් - ගෘහ භාණ්ඩ | | 500 |
| තොග | 5,620 | |
| මුදල් සහ බැංකු ශේෂ | 1,580 | |
| බැංකු අයිරාව | | 2,320 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | 2,980 | |
| වෙළෙඳ ණයගැතියන් | 1,300 | |
| වෙළෙඳ ණයහිමියන් | | 1,690 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 වර්ෂය තුළදී, ආයතනය විසින් රු.5,380,000/- ක් වටිනා ආලෝකකරණ උපාංග ණය පදනමට ආනයනය කරන ලදී. මෙම ආනයනික උපාංගවල වටිනාකමින් 80% ක් සහ ආරම්භක ණයහිමි ශේෂය මෙම වර්ෂය තුළදීම ගෙවා දමන ලදී.

(2) **ආලෝකා** විසින් වර්ෂය තුළ කළ විකුණුම් මත 20% ක දළ ලාභ ආන්තිකයක් පවත්වාගන්නා ලදී.

(3) විකුණුම්වලින් 60% ක් අත්පිට මුදලට වන අතර, ඉතිරිය ණය පදනම මත වේ. ණයට විකුණුම්වලට අදාළ ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල්වලින් 60% ක් වර්ෂය තුළදීම ලැබුණි. වර්ෂය ආරම්භයේ පැවති සියලුම ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් ද, වර්ෂය තුළදී සම්පූර්ණයෙන් ලැබුණි.

(4) 2022 දෙසැම්බර් 31 දිනට පැවති තොගය රු.3,580,000/- කට අගයකොට ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2022 ජනවාරි 01 දිනට, **ආලෝකා එන්ටප්‍රයිසස්** හි ප්‍රාග්ධනය (ස්කන්ධය) **ගණනය කරන්න**. (ලකුණු 02)

(b) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ආලෝකා එන්ටප්‍රයිසස්** හි විකුණුම් **ගණනය කරන්න**. (ලකුණු 02)

(c) 2022 දෙසැම්බර් 31 දිනට **ආලෝකා එන්ටප්‍රයිසස්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(i) වෙළෙඳ ණයගැති පාලන ගිණුම. (ලකුණු 03)

(ii) වෙළෙඳ ණයහිමි පාලන ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

2021 ජනවාරි 01 දින, **සුමුදු, මලිඳු** සහ **චමිඳු** එක්ව **SMC කන්ස්ට්‍රක්ෂන්** නමින් හවුල් ව්‍යාපාරයක් පිහිටුවන ලදි. **SMC කන්ස්ට්‍රක්ෂන්** හි 2022 වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත:

(1) ව්‍යාපාරය ආරම්භයේදී එක් එක් හවුල්කරු විසින් පහත සඳහන් පරිදි ප්‍රාග්ධනය යොදවා ඇත:

| | **රු.** |
|---|---|
| **සුමුදු** | 2,000,000 |
| **මලිඳු** | 1,500,000 |
| **චමිඳු** | 1,200,000 |

(2) පහත සඳහන් තොරතුරු හවුල් ගිවිසුමෙන් උපුටාගෙන ඇත:

- සෑම හවුල්කරුවෙකුම මාසිකව රු.85,000/- ක වැටුපක් ලැබීමට හිමිකම් ඇත.
- එක් එක් හවුල්කරුවන් විසින් ව්‍යාපාරය ආරම්භයේදී යොදවන ලද ප්‍රාග්ධනය මත වාර්ෂිකව 12% ක පොලියක් ගෙවනු ලබයි.
- හවුල්කරු විසින් ව්‍යාපාරය වෙත ලබාදී ඇති කිසියම් ණය මුදලක් වේ නම් ඒ සඳහා වාර්ෂිකව 15% ක පොලියක් ගෙවනු ලබයි.
- **සුමුදු, මලිඳු** සහ **චමිඳු** පිළිවෙලින් 2:1:1 අනුපාතයට ලාභා'ලාභ බෙදාගනු ලැබේ.

(3) 2022 ජූලි 01 දින **මලිඳු** විසින් රු.1,000,000/- ක ණය මුදලක් ව්‍යාපාරයට ලබාදී ඇත. නමුත් මීට අදාල ණය පොලිය ගිණුම් පොත්වල සටහන්කොට නොමැත.

(4) 2022 ජනවාරි 01 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ශේෂයන් පහත සඳහන් පරිදි විය:

*(රු.'000)*

| | **හර** | **බැර** |
|---|---|---|
| ජංගම ගිණුම්: | | |
| **සුමුදු** | 500 | |
| **මලිඳු** | | 1,500 |
| **චමිඳු** | 400 | |

(5) **SMC කන්ස්ට්‍රක්ෂන්** හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු.23,200,000/- ක් විය. ලාභය ගණනය කිරීමේදී වර්ෂය තුළදී හවුල්කරුවන්ට හිමි වැටුප්, පරිපාලන වියදම් යටතේ සටහන් කොට ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **SMC කන්ස්ට්‍රක්ෂන්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ලාභා'ලාභ විසර්ජන ගිණුම. (ලකුණු 06)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**"අසරණයන්ට සරණ"**` යනු වීදි සතුන්ට උදව් කිරීම පිණිස පිහිට වූ ලාභ අරමුණු කර නොගත් සංවිධානයකි. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංවිධානයේ ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත පරිදි විය:

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුම** *(රු.'000)*

| | | | |
|---|---|---|---|
| 2022 ජනවාරි 01 දිනට ඉ/ගෙ ශේෂය | 56 | කාර්ය මණ්ඩල වැටුප් වියදම් | 1,620 |
| පරිත්‍යාග | 2,950 | එන්නත්කරණ වියදම් | 894 |
| සාමාජික ගාස්තු ලැබීම් | 206 | ඖෂධ | 224 |
| සමරු සටහන් විකිණීමෙන් ලද ආදායම | 1,295 | කුලිය, විදුලිය සහ ජලය | 216 |
| | | පශු වෛද්‍ය ජංගම රථ සේවා සඳහා ඉන්ධන | 348 |
| | | උපකරණ සඳහා කුලිය | 412 |
| | | 2022 දෙසැම්බර් 31 දිනට ප/ගෙ ශේෂය | 793 |
| | **4,507** | | **4,507** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සංවිධානය ආරම්භයේ සිටම පශු වෛද්‍යවරුන් 205 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන් වාර්ෂිකව රු.1,000/- බැගින් වූ නාමික සාමාජික ගාස්තුවකට දායක වේ.

- වර්ෂය තුළදී ලද සාමාජික ගාස්තුවල සංයුතිය පහත සඳහන් පරිදි වේ:

| අදාල වර්ෂය | සාමාජිකයින් ගණන |
|---|---|
| 2021 වර්ෂය සඳහා | 4 |
| 2022 වර්ෂය සඳහා | 199 |
| 2023 වර්ෂය සඳහා | 3 |

- 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සාමාජික ගාස්තු සියල්ලම 2022 වර්ෂය තුළදී ලැබුණු අතර, 2021 දෙසැම්බර් 31 දින වනවිට සාමාජිකයින් විසින් ඉදිරියට ගෙවූ සාමාජික ගාස්තු කිසිවක් නොතිබුණි.

(2) වර්ෂය තුළ ලද සියලුම පරිත්‍යාග 2022 ප්‍රවර්තන වර්ෂය සඳහා අදාල වේ.

(3) සංවිධානය සතුව 2018 ජුලි 01 දින රු.3,250,000/- ක පිරිවැයකට මිලට ගත් වාහනයක් තිබෙන අතර, එය පශු වෛද්‍ය ජංගම සේවාව සඳහා භාවිත කරන ලදී. එය වර්ෂයකට 20% බැගින් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(4) 2022 දෙසැම්බර් මාසයට අදාල රු.36,000/- ක් වන විදුලි හා ජල බිල්පත් ගිණුම් ගත කළ යුතුව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 06)

(b) සාමාජික ගාස්තු ගිණුම. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත රශ්මි සමාගම,** සෙල්ලම් බඩු නිෂ්පාදනයේ නිරතව සිටී. 2022 පෙබරවාරි මාසය සඳහා අමුද්‍රව්‍ය **X** ට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

- පෙබරවාරි 01 - ඒකකයක් රු.10.75 බැගින් ආරම්භක තොග ශේෂය ඒකක 800.
- පෙබරවාරි 05 - මිලදී ගැනුම්, ඒකකයක් රු.12/- බැගින් ඒකක 120.
- පෙබරවාරි 12 - නිකුත් කිරීම් ඒකක 200.
- පෙබරවාරි 17 - නිකුත් කිරීම් ඒකක 150.
- පෙබරවාරි 22 - මිලදී ගැනුම්, ඒකකයක් රු.15/- බැගින් ඒකක 300.
- පෙබරවාරි 28 - නිකුත් කිරීම් ඒකක 200.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 පෙබරවාරි මාසය සඳහා හරිත සාමාන්‍ය මිල ක්‍රමය [Weighted Average Cost (AVCO)] භාවිත කර අමුද්‍රව්‍ය **X** සඳහා ගබඩා ලෙජරය **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(B) **මිහිරි** (සේවක අංක 7890), **සීමාසහිත රශ්මි සමාගමේ** නිෂ්පාදන අංශයට අනුයුක්තව සේවය කරනු ලබන සුපරීක්ෂකවරියකි.

පහත සඳහන් තොරතුරු ඇයගේ 2022 දෙසැම්බර් මාසයට අදාල වැටුප හා සම්බන්ධ වේ:

(1) **මිහිරිගේ** මූලික වැටුප රු.85,000/- ක් වන අතර, ඊට 2022 දෙසැම්බර් මාසයේ සිට අදාල වන 10% ක මූලික වැටුප් වර්ධකය ද ඇතුළත් වේ.

(2) මූලික වැටුපට අමතරව, සතියක් සඳහා රු.2,500/- බැගින් වන ආහාර දීමනාවකට සහ මාසිකව රු.10,000/- බැගින් වන නිල ඇඳුම් දීමනාවකට ඇය හිමිකම් ලබයි.

(3) මාසය තුළදී රු.15,500/- ක අතිකාල ගෙවීමක් ඇය විසින් උපයා ඇත.

(4) 2022 නොවැම්බර් මාසයේදී, **මිහිරි** විසින් සමාගමෙන් ණය මුදලක් ලබාගෙන ඇති අතර, මෙම ණය මුදල සඳහා දෙසැම්බර් මාසයට අදාල ප්‍රාග්ධන ආපසු ගෙවීම් සහ පොලිය පිළිවෙලින් රු.12,000/- ක් සහ රු.1,800/- ක් විය. මෙම ණය මුදල ලබාගන්නා අවස්ථාවේදී, මාසිකව ඇයගේ වැටුපෙන් එය නැවත අයකර ගැනීමට ඇය කැමැත්ත ලබාදී ඇත.

(5) සේවක අර්ථසාධක අරමුදල [Employees Provident Fund (EPF)] සඳහා සේව්‍යයාගේ සහ සේවකයාගේ දායකත්වය, දළ වැටුපෙන් පිළිවෙලින් 12% ක් සහ 8% ක් වේ. සේවක භාර අරමුදල [Employees Trust Fund (ETF)] සඳහා සේව්‍යයාගේ දායකත්වය දළ වැටුපෙන් 3% ක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 දෙසැම්බර් මාසය සඳහා **මිහිරිගේ** ශුද්ධ වැටුප **ගණනය කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

බැග් නිෂ්පාදනයේ නිරත **සීමාසහිත රම්සි සමාගමට,** නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් (මැහුම් සහ නිමකිරීම්) සහ සේවා දෙපාර්තමේන්තුවක් (තාක්ෂණික) තිබේ.

2023 අප්‍රේල් 30 දිනෙන් අවසන් මාසය සඳහා පොදුකාර්ය පිරිවැය පිළිබඳ අයවැයගත දත්ත පහතින් දී ඇත:

| **පදනම** | **දෙපාර්තමේන්තු** | | |
|---|---|---|---|
| | **නිෂ්පාදන** | | **සේවා** |
| | **මැහුම්** | **නිමකිරීම්** | **තාක්ෂණික** |
| වක්‍ර ද්‍රව්‍ය (රු.) | 325,000 | 450,000 | 75,000 |
| වක්‍ර ශ්‍රමය (රු.) | 390,000 | 500,000 | 125,000 |
| භාවිත කරන ලද වර්ග ප්‍රමාණය (වර්ග අඩි) | 1,600 | 720 | 480 |
| සේවක සංඛ්‍යාව | 150 | 50 | 50 |
| යන්ත්‍ර වටිනාකම (රු.) | 1,800,000 | 1,200,000 | 600,000 |
| විදුලිය පරිභෝජනය (කිලෝවොට්) | 1,200 | 600 | 200 |
| සෘජු ශ්‍රම පැය ගණන | 12,000 | 8,000 | - |
| පිරිවැය විභජනය - තාක්ෂණික | 55% | 45% | - |

සමාගම විසින් 2023 අප්‍රේල් මාසය සඳහා පහත සඳහන් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ඇස්තමේන්තුගත කරන ලදී:

| **පිරිවැය අයිතමය** | **පිරිවැය (රු.)** |
|---|---|
| සේවක සුභසාධන | 250,000 |
| යන්ත්‍ර ක්ෂය | 720,000 |
| විදුලිය | 120,000 |
| කුළී | 280,000 |
| යන්ත්‍ර නඩත්තු පිරිවැය | 360,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරන්නේ කෙසේදැයි දැක්වෙන ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 07)

(b) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා සෘජු ශ්‍රම පැය මත පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය **ගණනය කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

2022 මාර්තු 31 දිනට, **සීමාසහිත C-ලංකා (පෞද්ගලික) සමාගමේ** ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | | 26,000,000 |
| 2021 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | 2,836,000 | |
| **දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට:** | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ අගය - රු. මිලියන 10) | 20,000,000 | |
| මෝටර් වාහන | 12,000,000 | |
| කාර්යාල උපකරණ | 2,550,000 | |
| **2021 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිල්ල | | 2,000,000 |
| මෝටර් වාහන | | 4,000,000 |
| කාර්යාල උපකරණ | | 1,020,000 |
| 2022 මාර්තු 31 දිනට තොගය - පිරිවැයට | 3,587,000 | |
| බැංකුවේ ඇති මුදල් | 1,274,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 6,037,000 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,225,000 |
| බැංකු ණය | | 4,650,000 |
| විකුණුම් | | 33,540,000 |
| විකුණුම් පිරිවැය | 13,416,000 | |
| ගෙවූ කාර්යාල කුලී | 333,000 | |
| ඉන්ධන වියදම් | 732,000 | |
| ප්‍රචාරණ හා අලෙවිකරණ වියදම් | 725,000 | |
| විකුණුම් කොමිස් වියදම් | 1,006,000 | |
| ජලය සහ විදුලිය | 432,000 | |
| කාර්යාල නඩත්තු වියදම් | 365,000 | |
| වැටුප්, සේවක අර්ධසාධක සහ සේවක භාර අරමුදල් | 9,084,000 | |
| බැංකු ගාස්තු | 12,000 | |
| බැංකු ණය පොලිය | 1,076,000 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 89,000 | |
| 2021 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 208,000 |
| ගෙවූ ආදායම් බදු | 625,000 | |
| ගෙවිය යුතු සේවක අර්ධසාධක (EPF) සහ සේවක භාර අරමුදල් (ETF) | | 11,000 |
| මෝටර් රථ ඉවත්කිරීම් | | 3,525,000 |
| | **76,179,000** | **76,179,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනට පැවති තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු.3,500,000/- ක් විය.

(2) 2022 ජනවාරි 01 දින, සමාගම විසින් නව අලෙවි කාර්යාලයක් රු.37,000/- ක් වූ මාසික කුලියකට ලබාගන්නා ලදී. කුලී ගිවිසුම අනුව, සමාගම විසින් මාස 06 ක කුලිය, අත්තිකාරම් ලෙස ගෙවිය යුතු වේ. මේ අනුව සමාගම විසින් මාස 9 ක කුලියට සමාන මුදලක් වර්ෂය තුළදී මෙම ගොඩනැගිල්ල සඳහා ගෙවන ලදී.

(3) සමාගම විසින් 2020 ජනවාරි 01 දින රු.4,000,000/- කට මිලදීගත් මෝටර් රථයක් 2021 දෙසැම්බර් 31 දින රු.3,525,000/- කට විකුණා ඇති අතර, විකිණීමෙන් ලද මුදල, මෝටර් රථ ඉවත්කිරීමේ ගිණුමට බැර කර ඇත. මෙයට අමතරව, මෝටර් රථය ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල වාර්තා කර නොමැත.

(4) දේපළ, පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| ගොඩනැගිල්ල | වර්ෂ 25 |
| මෝටර් වාහන | වර්ෂ 4 |
| කාර්යාල උපකරණ | වර්ෂ 5 |

(5) 2022 මාර්තු මාසයට අදාල රු.30,000/- ක විදුලි බිල, ගිණුම් පොත්වල සටහන් කළ යුතුව ඇත.

(6) 2021/22 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු.827,000/- ක් ලෙස ගණනය කර ඇති අතර මෙය ගිණුම් ගතකොට නොමැත. වර්ෂය තුළදී, සමාගම විසින් කාර්තුමය ආදායම් බදු වාරික ලෙස රු.625,000/- ක් ගෙවා ඇත.

(7) වෙළෙඳ ලැබිය යුතු මුදල් පිළිබඳව සමාලෝචනය කිරීමෙන් පසුව, 2022 මාර්තු 31 දිනට පවතින වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය මත 5% ක ප්‍රතිපාදනයක් පවත්වා ගැනීමට සමාගමේ කළමනාකරණය විසින් තීරණය කරන ලදී.

(8) 2022 මාර්තු 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් රඳවාගත් ඉපැයීම්වලින් රු.350,000/- ක මුදලක්, පොදු සංචිත ගිණුමට මාරුකිරීමට තීරණය කරන ලදී.

(9) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2022 ජූනි 10 දින ලබාදී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත C-ලංකා (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරීත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |